<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණය</u>
<u>(MT-5-2016) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය.</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් හඳුන්වා දී ඇති නව වැටුප් ප්‍රතිපත්තියට අනුකූලව මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයෙහි ( MT-5-2016 ) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා මෙම උසස් කිරීමේ පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දින සිට මධ්‍යම පළාතේ <u>පළාත් පාලන ආයතන තුළ</u> ක්‍රියාත්මක වේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම මධ්‍යම රජය විසින් සිදු කරන අතර, පසුව පළාත් රාජ්‍ය සේවය සඳහා අන්තර්ග්‍රහණය කර යොමු කිරීමෙන් පසු මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්වීම් ලිපි නිකුත් කරනු ලැබේ.

**01.සම්බන්ධවන ආයතන**

| | |
|---|---|
| 1.1.දෙපාර්තමේන්තුව | : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව.<br>යොමු අංකය:සීපීසී/සීඑල්ජී/1/2/2/1(II වෙළුම)<br>දිනය:2022.09.12 |
| 1.2.අමාත්‍යාංශය | : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.<br>යොමු අංකය: සීපීසී/සීඑම්එස්/01/07/07<br>දිනය: 2022.10.03 |
| 1.3.කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | : යොමු අංකය: DMS/D/පොදු/11-2<br>දිනය: 2012.12.19 |
| 1.4.ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය | : යොමු අංකය: $CPC/CS/2/7/SOR/CLG_6/2022$<br>දිනය: 2022.10.19 |
| 1.5. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | : යොමු අංකය: EST-2/06/CP-REC/0204<br>දිනය: 2025.01.07 |
| 1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | : යොමු අංකය: CPC/PSC/32/LG/PHI/SOR<br>: දිනය:2025.02.25 |

1.7. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:- යොමු අංකය:

දිනය:

**02.** පත් කිරීමේ බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 ....... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 02

3.2. ශ්‍රේණි : III, II, I, අධි ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් මහජන සෞඛ්‍යයට අදාල රෝග නිවාරණය ප්‍රධාන අරමුණ කරගත් පරිසර සෞඛ්‍ය කළමනාකරණය, බෝ වන හා බෝ නොවන රෝග පාලනය, ආහාර සෞඛ්‍ය, ජල සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය කළමණාකරණය, වාහක පාලනය, ගොඩනැගිලි හා ඉදිකිරීම් කළමණාකරණය, ආපදා කළමණාකරණය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යයන් සිදු කිරීම, සියළුම විෂයන්ට අදාළ මහජන සෞඛ්‍ය අණපනත් බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ආචාර්යවරයෙක් වශයෙන් උක්ත සියළු විෂයන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම, අධීක්ෂණ නිලධාරියෙකු වශයෙන් කාර්ය මණ්ඩල සහ වැඩ සටහන් අධීක්ෂණය සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

3.4. කාර්යයන් පැවරීම:

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර,මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාව හා කුසලතා පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**4. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය**

(සටහන - විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.)

**05.** වැටුප්:

5.1. වැටුප් කේත අංකය : MT – 5 - 2016

5.2. මාසික වැටුප් පරිමාණය : රු.31,635- 10x 445- 11x 660- 10x 730- 10x 750- රු.58,145/-

5.3.ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 31,635/- |
| II | පියවර 12 | 36,745/- |
| I | පියවර 23 | 44,075/- |
| අධි ශ්‍රේණිය | පියවර 32 | 50,645/- |

සටහන : වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතු ය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**06.** සේවා ගණයට අයත් තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් -ඇමුණුම 04

6.2. ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව:

- ❖ මහජන සෞඛ්‍ය පරික්ෂක - 33
- ❖ ආහාර හා ඖෂධ පරික්ෂක - 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරිමේ කාර්යය සඳහා III,II,I අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධාරි සේවක සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07.බඳවා ගැනීම ක්‍රමය:**

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදුකර පළාත් සභාව සඳහා පත්වීම් ලබා දීම සිදුකරනු ලැබේ.

**8.** කාර්යක්ෂමතා කඩඉම්.

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය/ලිඛිත පරික්ෂණය/ වෘත්තිය පරික්ෂණය /සහතික පාඨමාලාව/වෙනත්. |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම. | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගත විමට පෙර. | ලිඛිත පරික්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම. | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර. | ලිඛිත/වාචික සහ ප්‍රායෝගික පරික්ෂණයකි. |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම. | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර. | ලිඛිත පරික්ෂණයකි. |

(එක් එක් කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ විෂය නිර්දේශයන් ඇමුණුම 1, 2, 3 හි දැක්වේ)

8.2.කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වර්ෂයකට දෙවරක්.

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරික්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

2 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

3 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2015 - 03 - 18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

8.4.(අ). කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා නිර්දේශය.

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ වලට අදාලව, අයදුම්පත් කැඳවනු ලබන නිවේදනවල සඳහන් පරිදි විය යුතුය.

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවා ගැනීම් පරිපාටිය | නව උසස් කිරීමේ පරිපාටිය |
| (1).I. වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරික්ෂණය.<br>❖ විෂය ක්ෂේත්‍රයට අදාළ (ලිඛිත,වාචික, ප්‍රායෝගික)<br>❖ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (1). I.වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>❖ ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>❖ මුදල් රෙගුලාසි .(ඇමුණුම - 01) |
| (2).II. වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>❖ විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්න පත්‍රය<br>❖ කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි. | .(2) II.වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>❖ විෂයානුබද්ධ (ලිඛිත,වාචික,ප්‍රායෝගික)<br>❖ ආයතන සංග්‍රහය.<br>❖ මුදල්රෙගුලාසි(ඇමුණුම - 02) |
| | (3) .III. වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>❖ විෂයානුබද්ධ (බහුවරණ)<br>❖ විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා)<br>(ඇමුණුම 03) |

(ආ).පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂය සමත් නිලධාරින් මෙම උසස් කිරීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ).මෙම උසස් කිරීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයෙන් සමත්විය යුතු නිලධාරින්, පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ එක් එක් විෂයන්ට අනුරූපී වන මෙම උසස් කිරීමේ පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ විෂයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතු ය. අනුරූපී විෂයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ. පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා පරික්ෂණයෙන් අනුරූපි විෂයන් සමත් වී ඇත්නම් එම විෂයන් පමණක් නව උසස් කිරීමේ පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18
අනුමතයි

ආණ්ඩුකාර ලේකම්

(ඇ) නව උසස් කිරීමේ පරිපාටිය බලාත්මක වන දිනට I ශ්‍රේණියේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්, තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) මෙහි උපඡේද අංක (ඇ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය වෙනස් වුවද ,සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයට අදාළ කාල සීමාව වෙනස් නොවේ.

(ඊ) නිදහස් කිරිම.

ආචාර්ය තනතුරෙහි සේවය කරන නිලධාරින් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විසින් පවත්වනු ලබන ඉගැන්වීම් පිළිබඳව මාස 06 ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මාස 06 කට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබේ නම් III කාර්යක්ෂමතා කඩයිම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

**09. භාෂා ප්‍රවීණතාව.**

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර ලබාගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 03 - 18 ........ දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**10.** ශ්‍රේණි උසස් කිරිම.

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරිම.

10.1.1.සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1.සපුරාලිය යුතු සුදුසුකම්.

i. පත්වීම ස්ථිර කිරිම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරිමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.1.1.2. II ශ්‍රේණියට උසස් කිරිමේ ක්‍රමය.

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරිම සඳහා පත් කිරිම් බලධාරියා වෙත අදාළ නිලධාරියා විසින් ආකෘති පත්‍ර අංක - 01 අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරිම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කිරිමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2. II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරිම.

10.2.1.සාමාන්‍ය කාර්යය සාධනය අනුව,

10.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්:-

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක් සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරිමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 -03 - 18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

10.2.1.2. I ශ්‍රේණියට උසස් කිරිමේ ක්‍රමය.

සුදුසුකම් සම්පූර්ණ කරන නිළධරයන් I ශ්‍රේණියට උසස් කිරිම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරින් විසින් ආකෘති පත්‍ර අංක - 02 අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරිමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

10.3. I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරිම.

10.3.1. සාමාන්‍ය කාර්යය සාධනය අනුව උසස් කිරිම,

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරිම හා නියමිත වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්යය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරිමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2. අධි ශ්‍රේණියට උසස් කිරිමේ ක්‍රමය.

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරිම සඳහා පත් කිරීම් බලධාරියා වෙත අදාළ නිලධාරියා විසින් ආකෘති පත්‍ර අංක 03 අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරික්ෂා කිරිමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය- සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනය අනුව උසස් කිරිමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරින්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**11.** **තනතුරුවලට පත් කිරිම.**

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය. |
|---|---|---|
| ආහාර හා ඖෂධ පරික්ෂක | (i). මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරි තනතුරේ II ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත් II ශ්‍රේණියේ හෝ ඊට ඉහළ නිලධාරියෙකු විය යුතු ය.<br><br>(ii). මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් සඳහා වන ලන්ඩනයේ රාජකීය සෞඛ්‍ය සංගමය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමාව / කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත කල පුහුණු මධ්‍යස්ථානයකින් හෝ පිරිනමනු ලබන | අභ්‍යන්තර චක්‍රලේඛ මඟින් /රජයේ ගැසට් පත්‍රය /ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් පහත සඳහන් ක්‍රමය පදනම් කර ගනිමින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරික්ෂණයක් මඟින් තෝරා ගැනේ.<br>ආහාර හා ඖෂධ පරික්ෂක ප්‍රවීණතා විභාගය සමත් දිනය හා එම විභාගයේ කුසලතාවය පදනම් කරගෙන සකස් |

| | | |
|---|---|---|
| | ඩිප්ලෝමා සහතිකය / මස් වර්ග සහ අනෙකුත් ආහාර පරීක්ෂා කිරීම සඳහා ලන්ඩනයේ රාජකීය සෞඛ්‍ය සංගමය විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමාව හෝ ආහාර හා ඖෂධ පරීක්ෂා කිරීම සඳහා තෙමස් පුහුණුවකින් පසු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සහතිකය ලබා තිබීම.<br><br>(iii).අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05)සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | කරනු ලබන යෝග්‍යතා හා කුසලතා ලේඛනයක් අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල ලේඛණය අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන්ගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාපය ලකුණු කිරීමට අවස්ථාව ලබාදී පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සඳහා පත්කිරීම් බලධාරියා විසින් බඳවා ගනු ලැබේ. |

**12.රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-** අදාල නොවේ.

**13.ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය** (බඳවා ගැනීමේ පරිපාටිය) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු වූවන් සඳහා, නව උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව MT 5-2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ 7 පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලග වැටුප් පියවරේ තැබීම ද නොකල යුතු ය.

සේවයේ II “ආ” ශ්‍රේණියේ නිලධාරින් නව උසස් කිරීමේ පරිපාටියේ III ශ්‍රේණියට.
සේවයේ II “අ” ශ්‍රේණියේ නිලධාරින් නව උසස් කිරීමේ පරිපාටියේ II ශ්‍රේණියට.
සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් නව උසස් කිරීමේ පරිපාටියේ I ශ්‍රේණියට
අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

“සේවයේ I ශ්‍රේණියේ වසර දහය(10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ I ශ්‍රේණියට අදාළ වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට ” අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
(අයදුම්පත-ආකෘතිපත්‍ර අංක - 04 අනුව)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 03 - 18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**14.** අන්තර් කාලීන විධිවිධාන.

14.1. ශ්‍රේණි උසස් කිරීම් විධිවිධාන.

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I වන ශ්‍රේණියේ උසස් වීම් ලබාදීම යන මැයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2012.03.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹ ඇති තීරණය අනුව 2010.11.01 දින සිට 2015.12.31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වේ.මෙම අන්තර් කාලය තුළ II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ උසස්වීම් පහත පරිදි ලබා දෙනු ඇත. (මේ සඳහා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.)

14.1.1. II අ බණ්ඩයට / II ශ්‍රේණියට උසස් කිරීම.

පුහුණු කාලය ද ඇතුළුව II "ආ" බණ්ඩයේ / II ශ්‍රේණියේ වසර 08ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම් සමත් නිලධාරින් II "අ" බණ්ඩයට/ II ශ්‍රේණියට උසස් කරනු ඇත.

14.1.2. I ශ්‍රේණියට උසස් කිරීම.

II "අ" බණ්ඩයේ වසර 09 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිළධාරින් හිඟ වැටුප්, අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීමකින් තොරව අදාළ සේවයේ I ශ්‍රේණියට උසස් කරනු ඇත.

**15.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිරව වන්නාවූ අර්ථ නිරූපණ හා නිර්වචන:-**

i. "ගරු ආණ්ඩුකාරතුමා " යන්නෙන් "මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා" අදහස් වේ.

ii. "කොමිෂන් සභාව" යන්නෙන් "මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව" අදහස් වේ.

iii. "පත්වීම් බලධරයා "යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් අදහස් වේ.

iv. "අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් "මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා" අදහස් වේ.

v. "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ "පළාත් පාලන කොමසාරිස්" අදහස් වේ.

vi. "උසස් කිරීමේ පරිපාටිය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණය (MT 5 -2016 ) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය අදහස් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්

2015-03-18 දින

අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

vii. "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරන්නේ රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටුකිරිම මඟින්ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩයිම් සමත්වීම මඟින් ද , සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරිම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරිම මඟින් ද එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාල සීමාවක් වන්නේය.

viii. "සක්‍රීය සේවා කාලය" යනුවෙන් අදහස් කරන්නේ රජයේ,මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල වුවමනාවන්ට හෝ/ හා රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන කාල සීමාවයි.

ix. "ක්‍රියාත්මක වන දිනය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කරනු ලබන දිනය වේ.

**16.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

**17.** මෙම උසස් කිරීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන්, පැන නගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

<u>අතුරු වෛද්‍ය සේවාවේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය.</u>

<u>අදාල නිලධාරියා විසින් ම සම්පූර්ණ කළ යුතු ය.</u>

1. තනතුර........................................................................................................................
2. සේවා ස්ථානය .......................................................................................................
3. (අ). නිලධාරියාගේ මුලකුරු සමග නම:-............................................................

.........................................................................................................................

.

(ආ).සම්පූර්ණ නම:-.....................................................................................................

(ඇ).ජාතික හැඳුනුම්පත් අංකය:-..................................................................................

(ඈ).උපන් දිනය:-........................................................................................................

(ඉ).කාර්යාලයීය ලිපිනය :-..........................................................................................

(ඊ).පෞද්ගලික ලිපිනය:-.............................................................................................

(උ).දුරකථන අංකය:-..................................................................................................

4. (අ). පුහුණුවට බැඳුණු දිනය:-......................................................................................

(ආ). II ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ලද දිනය:-...............................................

**(ඇ).** II ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් දිනය / දිනයන්:-..........

..........................................................

(ඈ). II ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ස්ථිර කරන ලද දිනය:- ..............................................

( ඉ). II ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන දිනය:-
...........

5. II. ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රීය සේවා කාලය තුළ,

(අ).සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද?.....................

(ආ).එසේ නොමැති නම් ඊට හේතු.:-........................................................................

..........................................................................................................................

6. II ආ බණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය(10)ක සක්‍රීය සේවා කාලය තුළ,
වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර:-.........................................................................

..........................................................................................................................

7. (අ) උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ(05)ක සේවා කාලය තුළ විනය පරික්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද?...............................................................................
ඔව් නම් ඒ පිළිබඳ විස්තර:-.........................................................................................

..........................................................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති දිනය:- ...............................................................

ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................ ............................................

දිනය. නිලධාරියාගේ අත්සන.

නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතු ය.

ඉහත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

............................................ ............................................

දිනය. විෂය භාර නිලධාරියාගේ අත්සන.

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-</u>

මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුර දරණ..............................................................මයා සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහු මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුරේ III ශ්‍රේණියේ වසර හය(06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ..............................දිනට සම්පූර්ණ කර ඇති බවත්, III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත්/අසමත් බව සහතික කරන බවත්, දැනට විනය පරික්ෂණ කටයුතු ඇති /නැති බවත් ඉදිරියේදී, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන/ නොකරන බවත් ....................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු /නුසුදුසු බවත් නිර්දේශ කරමි/ නොකරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

................................ ..................................

දිනය. ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සඳහන් නිලධාරියා ..............................දින සිට II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව /නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ..................................

දිනය. පළාත් පාලන සහකාර කොමසාරිස්
අත්සන හා නිළ මුද්‍රාව.

පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සඳහන් නිලධාරියා.................................. දින සිට II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව /නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ..................................

දිනය. පළාත් පාලන කොමසාරිස්
අත්සන හා නිළ මුද්‍රාව.

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය:-

ඉහත නිලධාරියා .........................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි/ නොකරමි.

................................ ..................................

දිනය. ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,
අත්සන හා නිළ මුද්‍රාව.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2015-03-18... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ආකෘතිපත්‍ර අංක - 02.

<u>අතුරු වෛද්‍ය සේවාවේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය.</u>

<u>අදාල නිලධාරියා විසින් ම සම්පූර්ණ කළ යුතු ය.</u>

1. තනතුර:-

   .......................................................................................................................................

2. සේවා ස්ථානය-

   ...............................................................................................................................

3. (අ). නිලධාරියාගේ මුලකුරු සමග නම:...........................................................................

   .........................................................................................................................................

   (ආ).සම්පූර්ණ නම:-............................................................................................................

   (ඇ).ජාතික හැඳුනුම්පත් අංකය:-..........................................................................................

   (ඈ).උපන් දිනය:-...............................................................................................................

   (ඉ).කාර්යාලයීය ලිපිනය :-...................................................................................................

   (ඊ).පෞද්ගලික ලිපිනය:-......................................................................................................

   (උ).දුරකථන අංකය:-...........................................................................................................

4 . (අ). පුහුණුවට බැඳුණු දිනය:-..................................................................................................

   (ආ). II ආ ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ලද දිනය:-..........................................................

   (ඇ). II ආ ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ස්ථිර කරන ලද දිනය:- ............................................

   **(ඈ).** II අ ඛණ්ඩයේ / II ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-

   **(ඉ).** II අ ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් දිනය / දිනයන්:-..........

   ..........................................................

   (ඊ). II ඛණ්ඩයේ / II ශ්‍රේණියේ වසර දහය(10) ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන දිනය:-
..............

   ........................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

5. II. අ. ඛණ්ඩයේ / II ශ්‍රේණියේ වසර දහය(10)ක සේවා කාලය තුළ ,

   (අ). නියමිත දිනට සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද :-..........................................

   (ආ).එසේ නොමැති නම් ඊට හේතු. :-...................................................................................

   .........................................................................................................................................

6. II අ ඛණ්ඩයේ / II ශ්‍රේණියේ වසර දහය(10)ක සේවා කාලය තුළ ලබාගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර:-.......................................................................

   ...................................................................................................................................

7. (අ) උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ(05)ක සේවා කාලය තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද?.......................................................................................

(ආ)ඔව් නම් ඒ පිළිබඳ විස්තර:-.......................................................................................

..........................................................................................................................

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති දිනය:- ...............................................................

ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................ ............................................

දිනය. නිලධාරියාගේ අත්සන.

නිලධාරියාගේ <u>පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.</u>

ඉහත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

............................................ ............................................

දිනය. විෂය භාර නිලධාරියාගේ අත්සන

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-</u>

මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරණ............................................................මයා සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්,ඔහු මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ III ශ්‍රේණියේ වසර හය(06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ..............................දිනට සම්පූර්ණ කර ඇති බවත්, III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්/අසමත් බව සහතික කරන බවත්, දැනට විනය පරීක්ෂණ කටයුතු ඇති /නැති බවත් ඉදිරියේදී, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන/ නොකරන බවත් ....................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු /නුසුදුසු බවත් නිර්දේශ කරමි/ නොකරමි.

............................... ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-03-18 දින අනුමත කරන ලදී. ..................................

දිනය. ආණ්ඩුකාර ලේකම් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිළ මුද්‍රාව.

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සදහන් නිලධාරියා ..............................දින සිට II ශ්‍රේණියට උසස් කිරිම සුදුසු බව /නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ...................................

දිනය. පළාත් පාලන සහකාර කොමසාරිස්
අත්සන හා නිළ මුද්‍රාව.

පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සදහන් නිලධාරියා ..............................දින සිට II ශ්‍රේණියට උසස් කිරිම සුදුසු බව /නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ...................................

දිනය. පළාත් පාලන කොමසාරිස්
අත්සන හා නිළ මුද්‍රාව.

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය:-

ඉහත නිලධාරියා .........................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරික්ෂක තනතුරේ I ශ්‍රේණියට උසස් කිරිම අනුමත කරමි/ නොකරමි.

................................ ...................................

දිනය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,
අත්සන හා නිළ මුද්‍රාව.

ආකෘතිපත්‍ර අංක - 03.

අතුරු වෛද්‍ය සේවාවේ I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය.

අදාල නිලධාරියා විසින් ම සම්පූර්ණ කළ යුතු ය.

1. තනතුර :-..........................................................................................

2. සේවා ස්ථානය :-..................................................................................

3. (අ). නිලධාරියාගේ මුලකුරු සමග නම :-..................................................
..........................................................................

(ආ).සම්පූර්ණ නම:-..................................................................................
..........................................................................................................

(ඇ).ජාතික හැඳුනුම්පත් අංකය:-.................................................................

(ඈ).උපන් දිනය:-......................................................................................

(ඉ).කාර්යාලයීය ලිපිනය :-..........................................................................

(ඊ).පෞද්ගලික ලිපිනය:-............................................................................

(උ).දුරකථන අංකය:-.................................................................................

4. (අ). පුහුණුවට බැඳුණු දිනය:-....................................................................

(ආ). II ආ ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ලද දිනය:-....................................

(ඇ). II ආ ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ස්ථිර කරන ලද දිනය:- ..................

(ඈ). II අ ඛණ්ඩයේ / I ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-................................

(ඉ). I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් දිනය / දිනයන්:-...................
...............................................................

(ඊ).I ශ්‍රේණියේ වසර දහය(10)ක සක්‍රීය සේවා කාලය සම්පූර්ණ වන දිනය:........................

5. I ශ්‍රේණියේ වසර දහයක දහය(10)ක සේවා කාලය තුළ

(අ).සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද?......................

(ආ).එසේ නොමැති නම් ඊට හේතු.:-..........................................................
..........................................................................................................

6. I ශ්‍රේණියේ වසර දහය(10)ක කාලය තුළ ලබාගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර:- ..........................................................................
..........................................................................................................

7. (අ) උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ(05)ක සේවා කාලය තුළ විනය පරික්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද?..........................................................................

(ආ) ඔව් නම් ඒ පිළිබඳ විස්තර:-..............................................................
..........................................................................................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-03-18 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති දිනය:- ..........................................................................

ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................ ............................................

දිනය. නිලධාරියාගේ අත්සන.

<u>නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.</u>

ඉහත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

............................................ ............................................

දිනය. විෂය භාර නිලධාරියාගේ අත්සන.

<u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:-</u>

මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර දරණ..............................................................මයා සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහු මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ II ශ්‍රේණියේ වසර හය(06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ..............................දිනට සම්පූර්ණ කර ඇති බවත්, II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්/අසමත් බව සහතික කරන බවත්, දැනට විනය පරීක්ෂණ කටයුතු ඇති /නැති බවත් ඉදිරියේදී, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන/ නොකරන බවත් ...................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ අධි ශ්‍රේණියට උසස් කිරීම සුදුසු /නුසුදුසු බවත් නිර්දේශ කරමි/ නොකරමි.

............................... ..................................

දිනය. ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 03 - 18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සඳහන් නිලධාරියා ............................................ දින සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව/නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ..................................

දිනය. පළාත් පාලන සහකාර කොමසාරිස්

අත්සන හා නිල මුද්‍රාව.

පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය:-

ඉහත නම් සඳහන් නිලධාරියා ...............................................දින සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව/නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ..................................

දිනය. පළාත් පාලන කොමසාරිස්

අත්සන හා නිල මුද්‍රාව.

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය:-

ඉහත නිලධාරියා.........................දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ අධි ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි/ නොකරමි.

................................ ..................................

දිනය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්,

අත්සන හා නිල මුද්‍රාව.

ආකෘතිපත්‍ර අංක - 04.

මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ

අතුරු වෛද්‍ය සේවා ගණය (MT-5-2016) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා වන උසස් කිරීමේ

පරිපාටිය අනුව නිලධාරීන් අන්තර්ග්‍රහනය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය.

1.කොටස.(නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුයි)

1. සම්පූර්ණ නම:-...............................................................................................
2. මුලකුරු සමග නම:-.........................................................................................
3. මුලකුරු වලින් හැඳින්වෙන නම:-.......................................................................
4. උපන් දිනය:-....................................................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය:-...............................................................................
6. දැනට සේවය කරන ස්ථානය:-............................................................................
7. මුල් පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය:-.........................................................
8. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ දිනය:-...............................................
9. පත්වීම ස්ථිර කල දිනය:-..................................................................................
10. දැනට දරන ශ්‍රේණිය:-......................................................................................
11. එම ශ්‍රේණියට පත්වූ දිනය:-...............................................................................
12. III,II,I කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල දිනය:- III.................. II..................... I.....................
13. උසස් කිරීමේ පරිපාටිය අනුමත කරන දිනට මුළු සේවා කාලය:-..................................................
14. උසස් කිරීමේ පරිපාටිය අනුමත කරන දිනට 3/2016 අනුව වැටුප් පියවර:-..........................................
15. වැටුප් වර්ධක දිනය:-..............(අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයන්හි වෙනසක් සිදු නොවිය යුතු ය)
16. නව උසස් කිරීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය වීමට අයදුම්කරන ශ්‍රේණිය:-................................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා නව උසස් කිරීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරමි/ නොකරමි.

දිනය:-.................................................        අයදුම්කරුගේ අත්සන:-........................

(පෞද්ගලික ලිපි ගොනුව භාරව සිටින නිලධාරියා විසින් සම්පූර්ණ කල යුතු අතර, අදාළ තොරතුරු සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛණ ඇමිණිය යුතු ය.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
.....2025-03-18..... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

ආයතන ප්‍රධානියා වෙත,

............................................................ලෙස සේවය කරන ..............................................................

මහතා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය හා නිවැරදි බවත්.................................දින ........................ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

දිනය:-.............                                                    ..........................................

විෂය භාර නිලධාරියාගේ අත්සන

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................                                                    ...................................

දිනය.                                                    ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිළ මුද්‍රාව.

**පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය.**

මෙම නිලධාරියා සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත.එබැවින්.....................................දින සිට ..........................ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරිම නිර්දේශ කරමි /නොකරමි.

දිනය:-.....................                                                    ................................................

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අත්සන.

නම:-

තනතුර:-

(නිළ මුද්‍රාව තබන්න.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 03 - 18 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය.

මෙම සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇත./නැත. එබැවින් .....................................දින සිට......................ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය:-......................

...............................................

පළාත් පාලන කොමසාරිස්ගේ අත්සන.

නම:-

තනතුර:-

(නිළ මුද්‍රාව තබන්න.)

අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය.

............................................................................................................................. මහතා සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත. එබැවින්.....................................දින සිට ..........................ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි/ නොකරමි.

දිනය:-......................

...............................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.

නම:-

තනතුර:-

(නිළ මුද්‍රාව තබන්න.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18...... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

අතුරු වෛද්‍ය සේවයේ මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරින්ගේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය.

අමාත්‍යාංශය: මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

නිලධර ගණය : අතුරු වෛද්‍ය සේවය

01.විභාගයේ නම: අතුරු වෛද්‍ය සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය.

02.විභාගය පිළිබඳ විස්තර.

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | රචනා ප්‍රශ්න 8 කින් සමන්විත අතර ඉන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතු ය. | පැය 03 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්න 8 කින් සමන්විත අතර ඉන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතු ය. | පැය 03 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා:- රේඛීය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :- වසරකට දෙවරක්.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය-

විෂය නිර්දේශය.

| | |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br><br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද - IV, XII, XIII, XIV, XIX, XLVII, XLVIII. |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ.<br><br>I වන පරිච්ඡේදය -වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරිම, (මුදල් රෙගුලාසි 1 සිට 68 දක්වා).<br><br>III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව,ප්‍රධාන ගණක නිලධාරි,ගණක නිල ආදායම් ගිණුම් නිලධාරින්,ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරිම,සහතික කිරිම,කාර්ය පැවරීම.(මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා) |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-03-18 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

<u>අතුරු වෛද්‍ය සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින්ගේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.</u>

අමාත්‍යාංශය: මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

නිලධර ගණය : අතුරු වෛද්‍ය සේවය

01.විභාගයේ නම:- අතුරු වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02.විභාගය පිළිබඳ විස්තර:

(අ).කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | රචනා ප්‍රශ්න 7 කින් සමන්විත අතර ඉන් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයිය යුතු ය. | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්න 7 කින් සමන්විත අතර ඉන් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයිය යුතු ය. | පැය 02 | 100 | 40% |

ආ).දෙපාර්තමේන්තු පරීක්ෂණය.

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත. | රචනා ප්‍රශ්න 8 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 0 3 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණ පාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණය | පරීක්ෂණය අනුව | 100 | 40% |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 03 - 18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

02. විභාගය පවත්වනු ලබන බලධරයා: රේඛීය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග: වසරකට දෙවරක්.

04.විභාගය සඳහා වන විෂය නිර්දේශය-

විෂය නිර්දේශය.

| | |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII. |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>1.VI වන පරිච්ඡේදය-<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය,අග්‍රිමය හා බැංකු ගිණුම්,රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය,සමීක්ෂණ මණ්ඩල,අයිරාව බැංකු ගිණුම්(මුදල් රෙගුලාසි 315 සිට 398 දක්වා)<br><br>2. XIII වන පරිච්ඡේදය-<br>සැපයුම් වැඩ හා සේවා සැපයීම/මිලට ගැනීමේ ක්‍රියාවලිය,ගබඩා සමීක්ෂණ ,ගබඩා ක්‍රියාවලිය,කොන්ත්‍රාත්,ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර වීම.(මුදල් රෙගුලාසි 705 සිට 775) දක්වා. |
| විෂයානුබද්ධ පරීක්ෂණය- ලිඛිත විභාගය. | 1.සාමාන්‍ය පරිපාලනය.<br>2.රක්තවේදය.<br>3.ක්ෂුද්‍ර ජීව විද්‍යාව.<br>4.අධ්‍යාපන විද්‍යාව.<br>5.පරපෝෂිතවේදය.<br>6.වෛද්‍ය කීට විද්‍යාව.<br>7.ආහාර සුරක්ෂිතතාව හා ස්වස්ථතාවය.<br>8.මානසික සෞඛ්‍යය.<br>9.පරිසර සෞඛ්‍යය.<br>10.ගොඩනැගිලි නිර්මාණය.<br>11.බෝවන රෝග.<br>12.පවුල් සෞඛ්‍යය.<br>13. බෝනොවන රෝග<br>14. පාසල් සෞඛ්‍යය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

| | |
|---|---|
| | 15. සෞඛ්‍ය අධ්‍යාපනය හා ප්‍රවර්ධනය.<br>16. සෞඛ්‍ය සැලසුම් හා කළමනාකරණය.<br>17. මහජන සෞඛ්‍ය නීතිය.<br>18. ජාතික සෞඛ්‍යය තොරතුරු පද්ධතිය.<br>19.ප්‍රථමාධාර. |
| විෂයානුබද්ධ පරික්ෂණය- ප්‍රායෝගික පරික්ෂණය. | 1.පාසල් සෞඛ්‍යය.<br>2.මහජනසෞඛ්‍යය නීතිය.<br>3.කාර්යාල පරිපාටිය.<br>4.වසංගතවේදීය ආවේක්ෂණ ක්‍රියාවලිය. |
| විෂයානුබද්ධ පරික්ෂණය,වාචික පරික්ෂණය. | විෂය ක්ෂේත්‍රයට අදාලව හා සේවයේ යෙදීමේ දී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරික්ෂණයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

අමාත්‍යාංශය: මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

නිලධර ගණය : අතුරු වෛද්‍ය සේවය

විභාගයේ නම: අතුරු වෛද්‍ය සේවයේ මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරින්ගේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය.

විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ (බහුවරණ) | බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. | පැය 0 2 | 50 | 40% |
| විෂයානුබද්ධ (රචනා) | පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න 5 න් 3 කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 50 | 40% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා: ජේඨිය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග:වසරකට දෙවරක්.

04.විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම. | |
|---|---|
| විෂයානුබද්ධ (බහුවරණ)<br><br>විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා).<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-03-18 දින අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | 1.පරිසර සෞඛ්‍යය<br>2.ආහාර සුරක්ෂිතතාවය හා ස්වස්ථතාව<br>3.අධීක්ෂණය.<br>4.බෝනොවන රෝග.<br>5.ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය.<br>6.කාර්යාල පරිපාටිය.<br>7.මහජන සෞඛ්‍ය නීතිය.<br>8.සෞඛ්‍ය සැලසුම් හා කළමනාකරණය<br>9.බෝනොවන රෝග හා වසංගතවේදීය ආවේක්ෂණය.<br>10.ජීව සංඛ්‍යා.<br>11.සෞඛ්‍යය පර්යේෂණ<br>12.ව්‍යාපෘති. |

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | මහනුවර මහා නගර සභාව (විශේෂ ශ්‍රේණිය) | 01 |
| | මහනුවර මහා නගර සභාව (අධි ශ්‍රේණිය,III,II,I) | 11 |
| 02. | මාතලේ මහා නගර සභාව | 04 |
| 03. | නුවරඑළිය මහා නගර සභාව | 04 |
| 04. | දඹුල්ල මහා නගර සභාව | 02 |
| 05. | ගම්පොල නගර සභාව | 03 |
| 06. | නාවලපිටිය නගර සභාව | 02 |
| 07. | කඩුගන්නාව නගර සභාව | 02 |
| 08. | හැටන් දික්ඔය නගර සභාව | 02 |
| 09. | තලවකැලේ නගර සභාව | 01 |
| එකතුව | | **32** |

**(මෙම තනතුර සඳහා ශ්‍රේණිගතව කාර්ය පැවරීමක් සිදු නොකෙරේ)**

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත ආහාර හා ඖෂධ පරීක්ෂක නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | මහනුවර මහා නගර සභාව | 01 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-03-18 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

1. ගාමිණී රාජකරුණා මහතා (සභාපති) ..............................

2. පී.ටී.පී.ගුණතිලක මහතා (සාමාජික) ..............................

3. සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ..............................

4. ටී.බී.එම්.එස්.ඩී. තෝරදෙණිය මහත්මිය (සාමාජික) - absent -

5. පී.එල්.පී. තිස්ස පී. මාරගෙල මහතා (සාමාජික) ..............................

දිනය : 2025.02.25

ආණ්ඩුකාර ලේකම් ,

2025.02.25 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2025/399 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණය (MT-5-2016) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2025/03/03

..............................

ලේකම් ,
රාජ්‍යසේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:-අනුමත කරමි. / ~~නොකරමි.~~

18/03/25

සරත් බී.එස්. අභයකෝන්
(BScEng, M.A.Sc., Ph.D, CEng, IntPE, FIESL, FNASSL)
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාල